# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2114/47 - 2019 මාර්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව දුනුවිදීමේ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අතුරු පාලක කමිටුව පත් කරමි.

| | | |
|---|---|---|
| 1. | වෛද්‍ය සීවලී ජයවික්‍රම මහතා | - සභාපති |
| 2. | නදීකා දමයන්ති මහත්මිය | - සාමාජික |
| 3. | ඩබ්. ඩී. එස්. ප්‍රනාන්දු මහතා | - සාමාජික |

තවද, ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමයේ නිළවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධිත රෙගුලාසි අනුව එම සංගමයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිළවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිළවරණ කමිටුව මගින් නිළවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

හරීන් ප්‍රනාන්දු, (පා.ම.)
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

03 - 1412

1A - G 29649 — 32 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*